(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 93.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 ජුනි මස 07 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0376/'10

1.
ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූණු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරු බදු සහ අනෙකුත් සියලු ආකාරයේ බදු ප්‍රමාණ කොපමණද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රමාණයන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ බදු පැනවීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(iv) එකී භාණ්ඩ අතරින් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන යම් භාණ්ඩ වේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල නිෂ්පාදන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල වාර්ෂික පරිභෝජනය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0802/'10

2.
ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0880/'10

3.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සම්පූර්ණ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ආ) එම එක් එක් වර්ෂයේදී,

(i) දේශන ගාස්තු වශයෙන් අයකර ගන්නා ලද මුදල;

(ii) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ අයදුම්පත් ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iii) එම විභාගයේ විභාග ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iv) වෙනත් ක්‍රම මගින් ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ලැබුණු ආදායම;

(v) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) 2009 වර්ෂය සඳහා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ දක්වා ඇති පරිදි දේශන ගාස්තු වැඩිකිරීමකින් තොරව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යෑමට නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1030/'10

4.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වතුකරයේ මන්දපෝෂණයෙන් පෙළෙණු ගර්භණී මව්වරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්දපෝෂණ තත්වයන් මගහැරවීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර වතුකරයේ ගර්භණී මව්වරුන්ගේ මන්ද පෝෂණය මඟහැරවීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1045/'10

5.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර තොග වෙළඳ සංස්ථාව හෙවත් ස.තො.ස. පෞද්ගලීකරණය කරන ලද දිනය කවරේද;

(ii) එවකට පැවති රජය කවරේද;

(iii) එම රජයේ ස.තො.ස. අදාළ විෂය භාර අමාත්‍යවරයා කවුරුන්ද;

(iv) ස.තො.ස. පෞද්ගලීකරණයෙන් රජයට සිදු වූ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පෞද්ගලීකරණය කරනු ලැබූ ස.තො.ස. නැවත රජයට පවරාගත් දිනය කවරේද;

(ii) එවකට පැවති රජය කවරේද;

(iii) ස.තො.ස නැවත රජයට පවරාගත් වකවානුවේ සිටි අදාළ විෂය භාර අමාත්‍යවරයා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1164/’11

6.

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි පන්ති තහනමට ලක්වූ සිසු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසු/සිසුවියන්ගේ නම් හා ඔවුන් පන්ති තහනමට ලක් කෙරුනු චෝදනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් අතුරින් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවසන් තීරණයක් ලබා දී ඇති සිසුන් සංඛ්‍යාව කවරේද;

(iv) පන්ති තහනමට ලක්වූ අනෙකුත් සිසුන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0449/’10

7.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාණිජ බැංකු සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කවරේද;

(ii) පෞද්ගලික බැංකුවල කොටස් රජය මිලදී ගනිමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සේවක අර්ථසාධක අරමුදල මගින් හෝ වෙනත් රාජ්‍ය ආයතනයක් මගින් මේ වනවිට පෞද්ගලික බැංකුවලින් රජය මිලදී ගෙන ඇති මුළු කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම එක් එක් බැංකුවෙන් මිලදීගත් කොටස්වල ප්‍රතිශතය සහ ඒ සඳහා වැය කළ සම්පූර්ණ මුදල එම මිලදීගැනීම සිදු කළ දිනයේ සිට එක් එක් වර්ෂයේදී, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොටස්වල මිල පහත වැටුනහොත් කොටස් මිලදීගැනීමේ අවදානම දරන්නේ කවරෙක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0822/'10

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හක්මණ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ඒ අතුරින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල්වල හා ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබා දෙන්නේද;

(iv) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත අ (i) හි සඳහන් පාසල් සංඛ්‍යාවෙන්,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව හා එම අවශ්‍යතාවල ස්වභාවය;

(iii) විද්‍යාගාර හා පුස්තකාල පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් පහසුකම් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් වෙත වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0904/'10

9.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ යුද, නාවික සහ ගුවන් හමුදා සඳහා අවි ආයුධ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීමේදී සිදුවූ බව කියන අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු ශිරානි තිලකවර්ධන මහත්මිය සභාපතිත්වය දැරූ කොමිෂන් සභාවක් අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම කොමිසම පත්කරන ලද දිනය කවරේද;

(iii) එකී කොමිසමේ සාමාජිකත්වය දැරූ අය කවරුන්ද;

(iv) එම කොමිසමේ වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත භාරදෙන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කොමිසමේ විෂයය පරාසය කුමක්ද;

(ii) එමගින් ආවරණය කරන ලද කාලසීමාව කවරේද;

(iii) එම කොමිෂන් සභා වාර්තාව පරිදි අක්‍රමිකතා හඳුනාගත්තේ නම්, ඒවා කවරේද;

(iv) එම වාර්තාව සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වාර්තාව මගින් අක්‍රමිකතා සඳහා වගකිවයුතු පුද්ගලයින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරුන්ද;

(iii) එම තැනැත්තන්ට එරෙහිව මේ වන විට ගෙන ඇති නීතිමය හෝ විනයානුකූල පියවර කවරේද;

(iv) එසේ පියවර නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1032/'10

10.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මන්දපෝෂණයෙන් පෙළෙනු ගර්භණී මව්වරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්දපෝෂණ තත්වයන් මගහැරවීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර උතුරු පළාතේ ගර්භණී මව්වරුන්ගේ මන්ද පෝෂණය මඟහැරවීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1165/'11

11.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1980 සිට 2011 පෙබරවාරි මාසය දක්වා රජයේ සේවකයින් සංඛ්‍යාව වැඩිවී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාල සීමාව තුළ ජීවන වියදම් දර්ශකය වැඩි වී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහළ යන ජීවන වියදමට සාපේක්ෂව රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0454/'10

12\.

ගරු රවි කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා 2010 ජූනි 8 සිට 10 දක්වා සිදු කළ ඉන්දීය සංචාරයේදී දමිළ ජාතිකයින් සඳහා නිවාස 50,000 ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකාවට රුපියල් බිලියන විසි හතරක් ප්‍රදානය කිරීමට ඉන්දීය රජය එකඟ වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල් භාවිතා කරමින් අද වන විට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකර ඇති ස්ථාන සහ එම නිවාස ලබාදුන් පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) නිවාස ඉදිකිරීමට පෙර ඉන්දියාව විසින් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිවාස ලබා දීම සඳහා අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් තෝරාගැනීමේදී භාවිතා කළ නිර්ණායක කවරේද;

(ii) ඔවුන් දමිළ ජාතිකයන්ද; මුස්ලිම් ජාතිකයන්ද; සිංහල ජාතිකයන්ද;

(iii) අවතැන් වූ සියලු පුද්ගලයන් පදිංචි කරවීම සඳහා නව නිවාස කොපමණ සංඛ්‍යාවක් ඉදිකිරීම අවශ්‍ය වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0823/'10

13\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1033/’10

14\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ, නැගෙනහිර පළාතේ මන්දපෝෂණයෙන් පෙළුණු ගර්භණී මව්වරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්දපෝෂණ තත්වයන් මගහැරවීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර නැගෙනහිර පළාතේ ගර්භණී මව්වරුන්ගේ මන්දපෝෂණය මගහැරවීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1166/’11

15\.
ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පොහොර සහනාධාර වැඩ පිළිවෙළ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පොහොර තොග බෙදුම්කරු ලෙස කෘෂිකාර්මික ගොවිජන වගාකරුවන්ගේ සංවිධානය ක්‍රියා කරන්නේද;

(ii) එම සංවිධානය පොහොර බෙදා හැරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2006 සිට 2010 දක්වා වාර්ෂිකව ඉහත තොග බෙදුම්කරු වෙත සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් නිකුත් කළ එක් එක් පොහොර වර්ග තොග ප්‍රමාණය කවරේද;

(ii) වර්ෂ 2009 වන විට එම තොග බෙදුම්කරු විසින් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට බෙදාහරින ලද එක් එක් පොහොර වර්ග ප්‍රමාණයන් කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම බෙදුම්කරුට ලැබුණු පොහොර ප්‍රමාණය හා බෙදා හරින ලද ප්‍රමාණය අතර සංසන්දනයට අනුව තොග ඌනතාවයක් පවතින්නේ නම්, ඒ කොපමණද;

(ii) පොහොර මෙට්‍රික් ටොන් එකක වෙළඳපොළ වටිනාකම අනුව එම ඌන තොගවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත තත්ත්වය හේතුවෙන් රජයට හා ගොවි ජනතාවට පාඩුවක් සිදුවී ඇති බවත්;

(ii) අදාළ බෙදුම්කරු විසින් වංචාවක් සිදුකර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ස්වාභිමානී දහම් සවිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නියෝගය (අංක 1),— (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 4 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2011 පෙබරවාරි 25 දිනැති අංක 1694/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නියෝගය (අංක 2),— (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 4 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2011 පෙබරවාරි 25 දිනැති අංක 1694/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නියෝගය (අංක 3),— (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 4 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2011 පෙබරවාරි 25 දිනැති අංක 1694/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2009 අංක 13 දරන මුදල් (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධිත 2002 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2011 ජනවාරි 17 දිනැති අංක 1689/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3), 14 සහ 20 වැනි වගන්ති යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 අප්‍රේල් 21 දිනැති අංක 1702/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011.05.25 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2011.04.21 දිනැති අංක 1702/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනතේ 8(2) වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි 14 දිනැති අංක 1536/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනතේ 8 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින්, එකී පනතේ 8 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ කාර්ය සඳහා විශේෂඥ මණ්ඩලයට තැනැත්තන් සහ ආයතනය පත් කරමින් සාදන ලදුව, 2010 ඔක්තෝබර් 28 දිනැති අංක 1677/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*9.

නාවික හමුදා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— බුද්ධිමය දේපළ පනත යටතේ නියෝගය,— 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 5 වැනි, 9 වැනි සහ 17 වැනි වගන්ති සමඟ කියවිය යුතු 204 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් පනවනු ලැබ, 2011 ජනවාරි 05 දිනැති අංක 1687/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා,— සත්ව පනත යටතේ නියමය,— 1958 අංක 29 දරන සත්ව පනතේ 3, 3අ, 11, 26 හා 34 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.
පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*13.
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*14.
සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.
විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.
විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.
සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.
මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*19.
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 16 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 16 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම — කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරී

ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට<br>රු. 300,000,000 දක්වා | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 260,000,000 සිට<br>රු. 300,000,000 දක්වා | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*20.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 17 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 17 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 01602 “අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම — අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,500,000 සිට<br>රු. 400,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*21.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 18 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 18 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම — රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 120,000,000<br>රු. 105,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 0<br>රු. 20,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*22.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 19 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 19 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම — ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,300,000,000<br>රු. 1,800,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 4,067,000,000<br>රු. 4,750,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 500,000,000<br>රු. 800,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*23.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 20 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 20 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 23202 "බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුම — බන්ධනාගාර දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 153,000,000<br>රු. 89,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 175,000,000<br>රු. 98,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*24.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 24 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 24 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් ගිණුම — රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 5,550,000 සිට<br>රු. 4,700,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*25.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 25 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 25 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 25003 "විවිධ අත්තිකාරම් ගිණුම — රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 50,000,000<br>රු. 30,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 250,000,000<br>රු. 37,200,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 200,000,000<br>රු. 560,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*26.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 8),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම, පරිවර්තන ගාස්තු හා කාර්යය මණ්ඩලය වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 3,800,000,000<br>රු. 1,900,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 1,000,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*27.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*28.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

30.

සමනලගිරි සතරාංග (නාඩි) වෛද්‍ය සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

31.

ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**